ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව | உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம் | Domestic Operations Department

2020 ජූලි 03

<u>මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/002</u>

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,**

**'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම**

'රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත ඉදිකිරීම් අංශය සඳහා දෙනු ලබන ද්‍රවශීලතා පහසුකම' පිළිබඳව 2020 ජූනි මස 18 වන දින නිකුත් කරන ලද අංක 35/03/023/0001/001 දරන මෙහෙයුම් උපදෙස් වෙනුවට මෙම මෙහෙයුම් උපදෙස් බලපැවැත් වේ.

මෙම මෙහෙයුම් උපදෙස් 2020 ජූලි 03 වන දින සිට නැවත දැනුම් දෙනු ලබන තෙක් බලපැවැත් වෙනු ඇත.

**1. හැඳින්වීම**

1.1 කොරෝනා (කෝවිඩ් 19) වසංගතයේ බලපෑමට ලක්වූ ආර්ථික කටයුතු යළි පණගැන්වීම ජාතික අවශ්‍යතාවක් ලෙස හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රජයේ උපදෙස්වලට අනුකූලව ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා සහන සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ද්‍රවශීලතා පහසුකමක් හඳුන්වා දෙන ලදී.

1.2 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් අරමුදල් සපයා ගැනීමට ද්‍රවශීලතා පහසුකමක්, පළමුව 2020 ජූනි 16 සහ ඉන්පසුව 2020 ජූනි 26 වැනි දින මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 83(1) කොටස යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය පහසුකම් ලබා ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තමන් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ඇප වශයෙන් තැබූ පොරොන්දු නෝට්ටුවක් ඉදිරිපත් කළ යුතුය.

1.3 ඒ අනුව, 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා ණය ලබාදීම සහ සහනදායී පොලී අනුපාතිකයක් යටතේ වාණිජ බැංකුවලට ඉදිකිරීම් අංශය සඳහා වන ද්‍රවශීලතා පහසුකම මහ බැංකුව වෙතින් ලබාගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036  +94 112 346287  ddod@cbsl.lk  www.cbsl.gov.lk

## 2. ද්‍රවශීලතා පහසුකමෙහි මූලික අංග

2.1 පෙර ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති උදෙසා ශ්‍රී ලංකා රජය විසින් ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා නොපියවූ ශේෂයන් හේතුවෙන් එම ආයතනවලට ඇතිවී තිබෙන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමේ පහසුකමක් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන මෙම ද්‍රවශීලතා පහසුකම සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කෙරේ.

2.2 ඉදිකිරීම් අංශය සඳහා වන මෙම ද්‍රවශීලතා පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගන්නා සෑම අවස්ථාවකදීම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ ණය ගිවිසුමකට සහ ඇප ගිවිසුමකට එළඹිය යුතු වේ.

2.3 මුදල් නීති පනතේ 83(1) කොටසෙහි ප්‍රතිපාදනවලට යටත්ව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන වෙත 'කොන්ත්‍රාත්කරුවන් සඳහා නොපියවූ බිල්පත් ගෙවීම අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඇප සුරැකුම් ලෙස භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත පදනම් වූ පොරොන්දු නෝට්ටුවක් මහ බැංකුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සියයට 1 ක සහනදායී වාර්ෂික පොලී අනුපාතිකයකට දින 180 ක කාලසීමාවක් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට මෙම ණය පහසුකම ලබාදෙනු ලබයි. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ඇප මත එවැනි නව පොරොන්දු නෝට්ටු ඉදිරිපත් කිරීම හරහා බලපත්‍රලාභී වාණිජවලට බැංකුවලට නැවත නව ණය පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ලැබේ.

2.4 මෙම පහසුකම මත බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සියයට 3 ක් නොඉක්මවන පොලී ආන්තිකයක් පවත්වා ගත හැකි අතර, එමඟින් ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා සියයට 4 ක් නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා ගැනීමට හැකි විය යුතුය.

## 3 ප්‍රධාන මෙහෙයුම් අවශ්‍යතා

3.2 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙම පහසුකම ලබාගැනීම සඳහා 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ආකෘති පත්‍ර I පරිදි ඉදිකිරීම් අංශයේ ආයතන විසින් ලබාගන්නා ලද ණය පිළිබඳ තොරතුරු සහ ආකෘති පත්‍ර II පරිදි පොරොන්දු නෝට්ටුවක්, ආකෘති පත්‍ර III පරිදි ඇපකර සඳහා තැබීමට අපේක්ෂිත රජයේ සුරැකුම් පත් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතුය. නිවැරදිව සම්පූර්ණ කොට බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි බලයලත් නිලධාරීන් විසින් අත්සන් කළ ආකෘති පත්‍ර I හා II හි දෘඪ පිටපත් (Hard Copies) අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ගිණුම්කරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීමට සියලුම ආකෘති පත්‍රවල මෘදු පිටපත් (Soft Copies) නොපමාව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

3.3 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඇපකර ලෙස තැබීමට අපේක්ෂිත භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල තොරතුරු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියට (Online Electronic Bidding System) ඇතුළත් කළ යුතු අතර, එවැනි ඇපකර වශයෙන් තැබූ සුරැකුම්පත්වල කල්පිරීමේ කාලය දින 180 කට නොඅඩු විය යුතුය. ඇපකර ලෙස තබන සුරැකුම්පත්හි මිල ගණන් නියම කිරීම සඳහා රජයේ සුරැකුම්පත් මිල කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට යොදාගනු ලබන ක්‍රමවේදයම භාවිතා කරනු ලැබේ.

3.4 නිවැරදිව සම්පූර්ණ කරනු ලැබූ ආකෘති පත්‍ර සහ ගිවිසුම්වල දෘඪ පිටපත් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවීමෙන් පසුව ආකෘති පත්‍ර III හි සඳහන් පරිදි ඇපකර වශයෙන් තැබූ සුරැකුම්පත්වල ප්‍රමාණවත්භාවය තහවුරු කොට අදාළ බැංකුවෙහි ජංගම ගිණුම වෙත අරමුදල් බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. කෙසේ වෙතත්, සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර සහ ගිවිසුම්වල දෘඪ පිටපත් 12:00 පැයට පෙර නොලැබුණහොත් එදිනම අරමුදල් පියවනු නොලැබේ.

3.5 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය සුරැකුම්පත් තොගය තුළ ඇප වශයෙන් තැබීමට ප්‍රමාණවත් වන පරිදි සුරැකුම්පත් ප්‍රමාණයක් අරමුදල් මුදාහරින අවස්ථාව වන විට පවත්වා ගත යුතුය. මෙම පහසුකම යටතේ ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන සුරැකුම්පත් ලංකාසෙක්‍යු පද්ධතියෙහි සුරැකුම්පත් පියවීම් ගිණුමට මාරු කරනු ලැබේ.

3.6 පොරොන්දු නෝට්ටු/ඇපකර කල්පිරීමට සති දෙකක කාලයකට පෙර, ඉදිරියට යෙදී ඇති කල්පිරීම් සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

3.7 ණය කල්පිරෙන දිනයේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදෙන ලද අරමුදල් ප්‍රමාණය සහ ඊට අදාළ පොලී ප්‍රමාණය අදාළ වාණිජ බැංකුවේ ජංගම ගිණුමෙන් හර කරනු ඇත. 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' අනුව රජය විසින් නියමිත පරිදි හිඟ ගෙවීම් ගෙවූ අවස්ථාවකදී, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල සහ ඊට අදාළ පොලිය පියවීම කඩිනමින් සිදු කළ යුතුය.

3.8 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශයේ ආයතන වෙත ලබාදුන් අරමුදල් ද්‍රවශීලතා පහසුකම යටතේ ඉදිකිරීම් අංශය සඳහා ලබාදුන් බවට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තහවුරු කළ යුතුය.

3.9 මෙම මෙහෙයුම් උපදෙස් යටතේ ලබාගත් අරමුදල්වල භාවිතය පිළිබඳ තොරතුරු වාර්තාවක් දෙසතියකට වරක් එනම් සෑම මසකම 15 වන දින සහ 30 වන දිනෙන් පසුව එළඹෙන වැඩ කරන දින 3 ක් ඇතුළත, ඇමුණුම් අංක II පරිදි දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

3.10 බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම පහසුකම ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරනු ලබයි.

**සී.ඒ. අබේසිංහ**
**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

**ඇමුණුම I**

මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/002

**'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම**

**බැංකුවේ නම: ..........................................................**

1. **පොරොන්දු නෝට්ටු අංකය:**
2. **පොරොන්දු නෝට්ටුවේ වටිනාකම:**
3. **නිකුත් කළ දිනය:**

| | කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද ණය පිළිබඳ තොරතුරු | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය | | | | | | |
| | මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපියේ යොමු අංකය | කොන්ත්‍රාත්කරුගේ නම | බැංකුවේ නම | වටිනාකම (රු.) | නිකුත් කළ දිනය | කල්පිරෙන දිනය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා (මහ බැංකු යොමු අංකය) |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |

.......................................... දිනය

.......................................... පරීක්ෂා කළේ

.......................................... අනුමත කළේ

**මෙම තොරතුරු විද්‍යුත් තැපැල හරහා** dod@cbsl.lk **වෙත යොමු කළ යුතුය.**

ඇමුණුම **II**

පොරොන්දු නෝට්ටු අංකය:

.............................................................

(බැංකුව විසින් නිකුත් කරන ලද)

## පොරොන්දු නෝට්ටුව

කොළඹ

දිනය: 2020/      /

රු. ...................................

.................................................................. (**සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය**), රුපියල් ............................................. (රු. .....................) මුදලක් මෙහි දාතමයේ සිට දින 180 කින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හෝ එහි අණට වාර්ෂිකව සියයට 1 ක ප්‍රතිශතයක් (1%) වූ පොලිය සමඟ ගෙවීමට පොරොන්දු වේ.

සහභාගිත්ව මූල්‍ය ආයතයේ නම

බලයලත් නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව

මුද්දර

**සාක්ෂිකරුවන්: 1. ...............................**
**2. ...............................**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
මහ බැංකුවේ යොමු අංකය:
කල්පිරෙන දිනය:
පොලිය සමඟ මුළු මුදල (රු):

ඇමුණුම **III**

මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/002

**'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම**

**ඇප වශයෙන් තබන ලද සුරැකුම්පත්වල තොරතුරු:**

1. **පොරොන්දු නෝට්ටු අංකය:**
2. **පොරොන්දු නෝට්ටු වටිනාකම:**
3. **නිකුත් කළ දිනය:**

| | භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල සුරැකුම්පත් හඳුනා ගැනීම් ජාත්‍යන්තර අංකය (ISIN) | ඇප වශයෙන් තබන ලද සුරැකුම්පත්වල මුහුණත අගය (රු.) | ඇප වශයෙන් තබන ලද සුරැකුම්පත්වල වෙළඳපොළ අගය (රු.) |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

.....................................
දිනය

.....................................................................................
අනුමත කළ නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව

**මෙම තොරතුරු විද්‍යුත් තැපැල හරහා** dod@cbsl.lk **වෙත යොමු කළ යුතුය.**

ඇමුණුම IV

මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/002

'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම

බැංකුවේ නම:

| | ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම භාවිතය පිළිබඳ දෙසති වාර්තාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | බැංකුව විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව | | | රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය | | | | | |
| | යොමු අංකය (ඇමුණුම II පරිදි) | කල්පිරෙන දිනය | දෙන ලද ණය මුදල (රු.) | යොමු අංකය | කොන්ත්‍රාත්කරුගේ නම | මුහුණත වටිනාකම (රු.) | නිකුත් කළ දිනය | කල්පිරෙන දිනය | 2020 ........ දිනට නොපියවූ ණය ප්‍රමාණය |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 5 | | | | | | | | | |

.................................... දිනය

.................................... පරීක්ෂා කළේ

.................................... අනුමත කළේ

මෙම තොරතුරු විද්‍යුත් තැපැල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.